**පස්ගොඩ ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 25 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට **පස්ගොඩ** ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේදී විවිධ ප්‍රතිපාදන යටතේ නිම කළ රු.2,046,286 ක් වටිනා ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.102,290 ක් වටිනා පරිගණක හා උපාංග ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේදී මිලටගත් රු.103,293 ක් වටිනා කාර්යාල උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සියළු ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පළාත් සභා ප්‍රතිපාදන යටතේ ආරම්භ කර නොතිබූ කර්මාන්ත 05 ක් | නිවැරදිව ගිණුම්ගත කළ | කර්මාන්ත ඉටු කිරීමට මුදල් |

| | | | |
|---|---|---|---|
| | වෙනුවෙන් රු.155,000 ක් ණයහිමි යටතේ ප්‍රතිපාදන සලසා තිබුණි. | යුතුවේ. | ප්‍රමාණවත් නොමැත. |
| (v) | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු රු.47,863 ක වැටුප් ප්‍රතිපූරණය අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය අවසානයට සහා අරමුදලෙන් ඉටුකරන ලද කර්මාන්ත සඳහා ගෙවියයුතු වියදම් වෙනුවෙන් රු.1,315,017 ක ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | අවිච්ඡේද කර ගෙවීම් කර ඇත. |
| (vii) | සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත 03 කට අදාලව කර්මාන්ත ණයගැති ශේෂය හා කර්මාන්ත ණයහිමි ශේෂය රු.475,998 ක් බැගින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ගිණුමට ලබා දී ඇත්තේ බිල් කළ වටිනාකම බවත් ගෙවීම් කිරීමේදී ඊට අඩු මුදල් ප්‍රමාණයක් ලැබී ඇත. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.3,461,121 ක් වූ ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.404,178 ක අසමානතා පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | උපලේඛනය තුළ හිඟ කඩ කාමර කුලී දඩ සමඟ ඉදිරිපත් කර ඇත. |

**(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.1,699,315 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම

## 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | | |
| | (i) | රීති 178 (7) | සභාවට ලැබෙන ටෙන්ඩර් අයදුම්පත්‍ර බහාලීම සඳහා ටෙන්ඩර් පෙට්ටියක් භාවිතාකර නොතිබූ අතර ටෙන්ඩර් විවෘත කරන තැනැත්තා විසින් ටෙන්ඩර්යේ එක් එක් පිටුවේ කෙටි අත්සන හා දිනය ඇතුළත් කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (ii) | රීති 218 | 2014 වර්ෂයෙන් පසු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | රීති ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | මූලික කටයුතු ආරම්භ කර ඇත. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 103 | ඉකුත් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් නොවූ රු.255,558 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | 2004/පුස/1 (2016 සංශෝධිත) හා 2016 දෙසැම්බර් 22 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරන ලෙස ඉල්ලීමක් කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය. | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර ආයතන 28 ක් පරිසර බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර පවත්වාගෙන ගොස් තිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මේ වන විට බලපත්‍ර දීමේ ක්‍රියාවලියට යොමුකර ඇත. |
| (ඈ) | 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/ පපාකො/2010/1 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 ඡේදය | කඩ කාමර 30 කට අදාල ගිවිසුම් වසර 03 කට වරක් යාවත්කාලීන කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල් අයකර ගෙන ඇති කඩහිමියන්ගේ ගිවිසුම් අලුත් කරන අතර හිඟ මුදල් නොගෙවා ඇති අයගේ සන්තකය පවරා ගැනීමට කටයුතු කරමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.15,677,599 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 14,039,152 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 1,712,000 | 1,673,275 | 1,674,580 | 96,092 | 1,460,000 | 1,414,010 | 1,409,801 | 97,397 |
| කුලී | 9,051,000 | 8,206,041 | 9,473,731 | 3,297,581 | 7,571,240 | 7,717,160 | 6,500,988 | 4,565,271 |
| බලපත්‍ර ගාස්තු | 584,650 | 755,167 | 755,167 | - | 661,200 | 328,892 | 328,892 | - |
| වෙනත් ආදායම් | 11,038,000 | 13,492,590 | 12,765,789 | 16,891,243 | 7,921,200 | 11,569,091 | 8,648,920 | 16,164,442 |
| එකතුව | 22,385,650 | 24,127,073 | 24,669,267 | 20,284,916 | 17,613,640 | 21,029,153 | 16,888,601 | 20,827,110 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත ආදායම රු.22,385,650 ක් විය. සමාලෝචිත වර්ෂයේ ආරම්භයට තිබූ රු.20,827,110 ක හිඟ මුදල හා බිල්කිරීම් රු.24,127,073 ක් සමඟ රු.44,954,183 ක් අයවීමට තිබූ අතර වර්ෂය තුළදී මුළු අයවීම් රු.24,669,267 ක් වීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ මුදල රු.20,284,916 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මෙම හිඟ මුදලින් අයවීම් සියයට 55 ක් වීමට හේතු වූයේ පළාත් සභා යටතේ ලැබිය යුතු මුද්දර ගාස්තු බිල් කිරීම් වලින් ලැබුණු මුදල සියයට 10 ක් තරම් අඩු අගයක් ගැනීම නිසාවේ. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **අක්කර බදු** | | |
| ආරම්භක හිඟ අක්කර බදු ශේෂය රු.97,397 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.25,154 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු අයවීම් රු.26,459 ක් වූයෙන්, වර්ෂය අවසානයට රු.96,092 ක් හිඟව පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 22 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මුදල් අය කර ගත නොහැකි ඉඩම් සම්බන්ධයෙන් සමීක්ෂණ වාර්තාවක් පිළියෙළ කර කපා හැරීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇත. |

### 2.2.4 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) **කඩ කුලී** | | |
| ආරම්භක හිඟය රු.2,539,221 ක් වූ අතර, රු.1,776,867 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.4,316,088 ක් අයවිය යුතුව තිබුණි. වර්ෂය තුළදී මුළු අයවීම් රු.1,003,943 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.3,312,145 ක් හිඟ ශේෂයක් පැවතුණි. අයවීමේ ප්‍රගතිය සියයට 23 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු ආරම්භ කර ඇත. |

(ආ) **පොළ බදු**

----------

| | | |
|---|---|---|
| ආරම්භක හිඟය රු.321,348 ක් වූ අතර, වර්ෂයේ බිල්කිරීම් රු.5,939,766 ක් සමඟ මුළු අයවීම් රු.6,049,626 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.211,488 ක් හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | මේ සම්බන්ධයෙන් නීතිමය කටයුතු ආරම්භ කර ඇත. |

## 2.2.5 බලපත්‍ර ගාස්තු

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **දැන්වීම් පුවරු ආදායම** | | |
| සමාලෝචිත වර්ෂයේදී බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 30 කින් රු.79,953 ක ගාස්තුවක් අයකර ගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2019 වර්ෂය සඳහා බලපත්‍ර ලබා ගන්නා ලෙස මේ වන විට දැනුවත් කර ඇත. |

## 2.2.6 වෙනත් ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **උසාවි දඩ හා මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට උසාවි දඩ රු.572,008 ක් හා මුද්දර ගාස්තු රු.15,521,989 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | 2018 වර්ෂය අවසාන වන විට උසාවි දඩ රු.279,916 ක මුදලක් ලැබී ඇති අතර හිඟ මුද්දර ගාස්තු රු.3,720,083 ක මුදලක් මේ වනවිටත් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම** | | |
| ඉකුත් වර්ෂයේදී ජංගම පුස්තකාලයක් ආරම්භ කිරීම සඳහා රු.2,175,000 ක් වැයකර මිලදී ගෙන තිබූ ටාටා සුපර් වර්ගයේ ට්‍රක් රථය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉහත අරමුණ සඳහා යොදාගෙන නොතිබුණි. | අදාළ කාර්යයෙහි අපේක්ෂිත අරමුණු ඉටුකර ගත යුතුවේ. | ජංගම පුස්තකාලයට උචිත අයුරින් රථය සකස් කිරීම සඳහා ප්‍රතිපාදන සපයා ගත නොහැකි වූ අතර 2020 වර්ෂයේදී අපේක්ෂිත ඉලක්කය වෙත ළඟා වීමට කටයුතු කරමි. |
| **(ආ) තිරසර සංවර්ධන ඉලක්ක** | | |
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයට අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමි. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 14 ක් සම්පූර්ණ කර ගැනීමටත්, 03 ක් වූ අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර | කාර්ය මණ්ඩලයේ අතිරික්ත තනතුරු විධිමත් කරගැනීම හා | ප්‍රජා සංවර්ධන නිලධාරී තනතුර පළාත් පාලන |

| | | |
|---|---|---|
| ගැනීමටත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය තුළ අනුමත තනතුරක් වේ. ඉතිරි පුරප්පාඩු සපුරාලීම සඳහා කාර්ය මණ්ඩල<br>තොරතුරු පළාත් පාලන සහකාර කොමසාරිස්, ප්‍රධාන ලේකම් හා අමාත්‍යාංශ ලේකම් වෙත වාර්තා කර ඇත. පුරප්පාඩු ලෙස පෙන්වන ප්‍රාථමික තනතුරු 09 ක් යටතේ බඳවා ගැනීම සඳහා ආණ්ඩුකාර අනුමැතිය ලබා ගෙන ඇත. |

## 3.3 ප්‍රසම්පාදනය

### 3.3.1 ප්‍රසම්පාදන සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන සැලැස්මකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගැනීම් වෙනුවෙන් රු.2,954,582 ක් වියදම් දරා තිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සභාවට මිලදී ගත් වැකුම් ක්ලිනර් යන්ත්‍රය සඳහා අඩුම මිල ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් රු.7,780 ට මිලදී නොගෙන තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු නොකර වැඩිම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයෙන් රු.18,905 කට මිලදී ගෙන තිබුණි. | ටෙන්ඩර් මණ්ඩල තීරණ තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කළ යුතුවේ. | ටෙන්ඩර් මණ්ඩලයෙන් ලබා ගන්නා ලද තීරණ තාක්ෂණික ඇගයීම් කමිටුව වෙත යොමු කර එහි නිර්දේශ ලබා ගැනීමෙන් පසු යළි ටෙන්ඩර් මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබා මිලදී ගැනීම් සිදු කරමි. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වැය විෂයන් 08 ක රු.14,193,947 ක ඉතිරිවීම් තිබුණි. එම අගයන් සියයට 5 සිට සියයට 79 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා නඩත්තු වැය විෂයන් තුළ ඉතිරියක් පෙන්නුම් කරනුයේ වාහන නඩත්තු හා අලුත්වැඩියා වියදම් අඩුවීමෙනි. |
| (ආ) | අදායම් විෂයන් 04 ක ළඟාකර නොගත් ඉලක්කවල එකතුව 5,822,532 ක් වූ අතර එම අගයන් සියයට 2 සිට 38 දක්වා පරාසයක පැවතුණි. | තාත්වික වන පරිදි වාර්ෂික ඇස්තමේන්තු ලේඛන පිළියෙල කළ යුතුවේ. | වෙනත් ආදායම් විෂය තුළ හිතකර විචලනයකට හේතුව පෙර වර්ෂ සඳහා හිග මුද්දර ගාස්තු ලෙස රු.2,845,471 ක මුදලක් ලැබීම හේතුවෙනි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134 පරිදි අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපතිගේ එකඟත්වය ලබාගෙන නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |